# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1948/54 - 2016 ජනවාරි මස 08 වැනි සිකුරාදා - 2016.01.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 45(2) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති විෂයයන්ගෙන් පහත කාර්යයන් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යවරයාට පවරන බව මෙයින් සඳහන් කරමි.

අකිල විරාජ් කාරියවසම්,
අධ්‍යාපන අමාත්‍ය.

වර්ෂ 2016 ක් වූ ජනවාරි මස 08 දින,
ඉසුරුපාය, පැලවත්ත,
බත්තරමුල්ල,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

*අධ්‍යාපන රාජ්‍ය අමාත්‍ය*

*කාර්යයන් සහ කර්තව්‍යයන්*

1. වතු අංශයේ පාසල් සංවර්ධනයට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

2. උතුරු හා නැගෙනහිර පළාත් වල පාසල් සංවර්ධනයට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

3. ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුකූලව ජාත්‍යන්තර පාසැල් අධීක්ෂණය.

4. විශේෂ අවශ්‍යතා ඇති සිසුන් සඳහා අධ්‍යාපන අවශ්‍යතා තහවුරු කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

5. ජාතික හා සන්ධාන භාෂා අධ්‍යාපනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

6. දෙමළ මාධ්‍ය ගුරු පුහුණු ආයතනවල වැඩසටහන් අධීක්ෂණ කටයුතු.

අධ්‍යාපන අමාත්‍යාංශයේ හා අදාළ ආයතන සමග සම්බන්ධීකරණය සිදු කරමින් ඉහත කාර්යයන් හා කර්තව්‍ය ඉටු කිරීම.

01 - 776


1A - G 22833 — 358 (2016/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*